# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2024 අගෝස්තු

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: **011-2147414** ෆැක්ස්: **011-2877945** ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2024 අගෝස්තු මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය (Headline Inflation) 1.1%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2024 ජූලි මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය 2.5%ක් ලෙස වාර්තා විය. 2024 අගෝස්තු මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 1.0% ක හා ආහාර නොවන කාණ්ඩයේ 0.1%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 2024 ජූලි මාසයේදී 2.9% සිට 2024 අගෝස්තු මාසයේ 2.3% දක්වා අඩු වී ඇති අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 2024 ජූලි මාසයේදී 2.2% සිට 2024 අගෝස්තු මාසයේදී 0.2% දක්වා අඩු වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පදනම:2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කළ විට, 2024 ජූලි මාසයේ 206.9ක් වූ දර්ශකාංකය, 2024 අගෝස්තු මාසයේ දී 204.1 ක් දක්වා අඩු වී ඇති බව වාර්තා විය. මෙමගින් 2024 ජූලි මාසයට සාපේක්ෂව 2024 අගෝස්තු මාසයේ දර්ශකාංකය 2.8ක අඩුවීමක් එනම් 1.36 ක ප්‍රතිශතාංක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩය 0.81% කින් අඩුවීම සහ ආහාර නොවන කාණ්ඩය 0.55% කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූ විට මිලෙහි අඩුවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත්තේ එළවළු, අලුත් මාළු, දෙහි, බිත්තර, කුකුලු මස්, පාන් (සාමාන්‍ය), සීනි, ඉගුරු, රතු ළූණු, මිරිස් කුඩු, මයිසූර් පරිප්පු, මුං ඇට, තිරිඟුපිටි, ළදරු කිරිපිටි, කිරිපිටි, වියළි මිරිස්, ලොකු ළූණු යන ආහාර ද්‍රව්‍යවල වේ. එහෙත්, සහල්, අලුත් පළතුරු, පොල්, කහ කුඩු, තේ කුඩු/කොළ සහ කරවල යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කළ විට, 2024 අගෝස්තු මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන'(*විදුලි බිල සහ ජල බිල*), 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'ප්‍රවාහන'(*ගුවන් ටිකට්පත් ගාස්තු*), 'රෙදිපිළි සහ පාවහන්'(*පාවහන්*), යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත්, 'විවිධ භාණ්ඩ සහ සේවා'(*මෝටර්රථ රක්ෂණය*) සහ 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය'(*පුවක්*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. තවද, 'ආපන ශාලා සහ හෝටල්' යන කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. තවදුරටත් සළකා බැලීමේදී, 'සෞඛ්‍ය', 'සංනිවේදන' 'විනෝදාත්මක සහ සංස්කෘතික' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අගෝස්තු මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පදනම: 2021=100) ලක්ෂ්‍යාමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්ඡාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2024 ජූලි මාසයේ 3.0% සිට 2024 අගෝස්තු මාසයේදී 2.3% දක්වා අඩුවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යාමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2023** | අගෝ. | 201.9 | 224.6 | 187.3 | 188.7 | 0.0 | 0.4 | 2.1 | -5.4 | 9.0 | 4.1 |
| | සැප්. | 203.5 | 226.7 | 188.5 | 189.0 | 0.8 | 0.2 | 0.8 | -5.2 | 5.9 | 1.7 |
| | ඔක්. | 203.6 | 224.1 | 190.4 | 189.2 | 0.0 | 0.1 | 1.0 | -5.2 | 6.3 | 0.6 |
| | නොවැ. | 206.0 | 228.1 | 191.8 | 189.3 | 1.2 | 0.1 | 2.8 | -2.2 | 7.1 | 0.8 |
| | දෙසැ. | 208.8 | 236.2 | 191.2 | 189.7 | 1.4 | 0.2 | 4.2 | 1.6 | 6.3 | 0.9 |
| **2024** | ජන. | 215.0 | 242.4 | 197.3 | 193.9 | 3.0 | 2.2 | 6.5 | 4.1 | 8.5 | 2.2 |
| | පෙබ. | 214.5 | 239.5 | 198.3 | 194.6 | -0.2 | 0.4 | 5.1 | 5.0 | 5.1 | 2.7 |
| | මාර්තු | 210.0 | 234.4 | 194.3 | 194.5 | -2.1 | -0.1 | 2.5 | 5.0 | 0.7 | 3.4 |
| | අප්‍රේල් | 208.2 | 231.1 | 193.4 | 193.9 | -0.9 | -0.3 | 2.7 | 3.3 | 2.3 | 3.0 |
| | මැයි | 206.3 | 227.3 | 192.8 | 193.6 | -0.9 | -0.2 | 1.6 | 0.5 | 2.4 | 3.1 |
| | ජූනි | 208.1 | 232.8 | 192.1 | 193.7 | 0.9 | 0.1 | 2.4 | 1.9 | 2.7 | 3.9 |
| | ජූලි | 206.9 | 234.0 | 189.4 | 193.7 | -0.6 | 0.0 | 2.5 | 2.9 | 2.2 | 3.0 |
| | අගෝ. | 204.1 | 229.7 | 187.6 | 193.0 | -1.4 | -0.4 | 1.1 | 2.3 | 0.2 | 2.3 |